ජා-ඇල නගර සභාව
----------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 21 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු. 690,000 ක් වූ ටේලර් 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මිලදී ගත් වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේදී වරද නිවැරදි කිරීමට කටයුතු කරනු බව දන්වමි. |
| (ආ) කම්පැක්ටර් රථයේ ගෙවා අවසන් නොකල රු.12,998,400 ක මුදල ප්‍රාග්ධනිත කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ 2014අගෝස්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවසාන ගිණුම සැකසීමේදී ජර්නල් සටහන මගින් අදාල වත්කමේ සම්පූර්ණ වැය වටිනාකමද ප්‍රග්ධනිත වටිනාකම ද ගිණුම්ගත කොට ඇති අතර කොටස් වශයෙන් වාරික ගෙවීමේ දී ඇති කළ වගකීම් ගිණුම ඊට සමානුරූපීව පියවෙනු ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ තොගය ලෙස රු.11,408,112 ක පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් කර භෞතික තොගය ගිණුම් ගත කළ යුතුවේ. | ගබඩා භෞතික තොගවල හා ප්‍රධාන ලෙජරයේ තොග ශේෂවල ඇති නොගැලපීම ලේඛන පරීක්ෂා කොට නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු දේපල ණය පොලී හා උපාධිධාරී අභ්‍යාසලාභී දීමනා රු.368,464 ක් ගිණුම්වල පෙන්වා තිබුණි. | 2019 සැප්තැම්බර් 19 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ LGD/01/D/2019/05 දරන ලිපිය අනුව ගිණුම් තැබිය යුතුවේ. | උපචිත පදනමට ගිණුම් නොතබා ලැබීම් පදනම යටතේ ගිණුම් තැබීමට සටහන් කර ගන්නා ලද බව දන්වමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 9,114,298 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඌනතාවය ලේඛණ පරීක්ෂා කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

1.3.3 ලැබිය යුතු හා ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂවල සිට පැවත එන රු.1,110,620 ක ලැබිය යුතු විදුලි ගාස්තු ශේෂය අයකර ගැනීමට හෝ අවශ්‍ය ගැලපීම් සිදුකර ගිණුම නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ඉකුත් වර්ෂවල ආරම්භකර තිබූ කර්මාන්ත 25 කට අදාලව අයකර ගත යුතු රු.6,691,399 ක් නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගනුදෙනුකරුවන්ගෙන් ලැබී අගරුවී තිබූ චෙක්පත් 04 කට අදාල රු.32,007 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ තුළ වර්ෂ 09 ක් ඉක්මවා තිබූ රු.22,404 ක චෙක්පතක් හා වර්ෂ 05 ක් ඉක්මවා තිබූ රු.7,353 ක චෙක්පතක් විය. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.872.63 ක චෙක්පත 2020 ජනවාරි 22 දින අයකර ගෙන ඇති බව දන්වමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.45,225,743 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා හිඟ ආදායම් වාර්තා හා කාල විශ්ලේෂණ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ විවිධ ඌනතා සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌනතාවයන් පිළිබඳ හා ඉන්වෙන්ට්‍රි ඌනතා පිළිබඳ පරීක්ෂා සිදුකර අදාල ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) මුදල් රෙගුලාසි 371(2) | සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබූ රු.1,132,826 ක් වූ අත්තිකාරම් 21 ක් හා 2012 වර්ෂයේ සිට 2015 දක්වා ලබාදී තිබූ රු.158,749 ක් වූ | අත්තිකාරම් මුදල් අදාල කාර්ය නිමවූ වහාම පියවීමට කටයුතු කළ යුතුවේ. | රු.424,608 ක් මේ වන විට පියවීමට කටයුතු කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් 02 ක් පියවීමට කටයුතු කර නොතිබුණි. | | |
| (iii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ඉක්මවා තිබූ රු.2,962,935 ක තැන්පත් මුදලක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ | රු.2,962,935 ක මුදල 2020 වර්ෂය තුළදී ආදායමට ගෙන තැන්පත් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිර්වාස හා කඩා ඉවත් කිරීම් ලෙස හිඟ වරිපනම් රු.793,581 ක් ග්‍රාම සේවක නිර්දේශයකින් තොරව කපා හැර තිබුණි. | ග්‍රාම සේවක නිර්දේශය ලබා ගත යුතුවේ. | ආදායම් පරීක්ෂක ලබාදෙන වාර්තාවේ විනිවිදභාවය තහවුරු කර ගැනීම සඳහා විගණනය මගින් පසු විපරමක් සිදු කිරීම හා ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර වැඩ පිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.41,081,341 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 51,255,753 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 45,250 | 44,157 | 28,361 | 28,292 | 42,950 | 44,211 | 27,602 | 23,558 |
| (ii) | කුලී | 10,055 | 10,464 | 10,464 | 684 | 9,337 | 9,624 | 9,624 | 567 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 952 | 997 | 997 | 7 | 738 | 1,166 | 1,166 | 7 |
| (iv) | වෙනත් ආදායම් | 86,460 | 47,756 | 47,756 | 3,494 | 94,614 | 50,626 | 50,626 | 3,494 |
| | | 142,717 | 103,374 | 87,578 | 32,477 | 147,639 | 105,627 | 89,018 | 27,626 |

2.2.2 වරිපනම් හා බදු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායමවූ රු.26,588,683 තුළ වර්ෂ 05 කට වැඩි රු.1,453,534 ක ශේෂයක් විය. | හිඟ ආදායම් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 කුලී

----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පොදු වෙළද පලෙහි ගවමස් කඩය 2019 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමේදී කිසිදු ටෙන්ඩරයක් ඉදිරිපත් වී නොතිබීම හේතුවෙන් මහා සභාවේ හදිසි තීරණයකින් අවම ටෙන්ඩර් මිල සියයට 10 කින් අඩුකර තිබූ අතර නැවතත් එදිනම හදිසි තීරණයකින් සියයට 15 ක් දක්වා අඩුකර තිබුණි.ඒ අනුව වාර්ෂික ටෙන්ඩර් වටිනාකම 2018 හා සැසදීමේදී රු.371,275 කින්ද හා තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදී තිබූ තක්සේරු වටිනාකමට වඩා රු.167,665 කින්ද අඩු වී තිබුණි. | වාර්ෂික තක්සේරු සංශෝධනය තක්සේරු දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ හා සභා අනුමැතිය යටතේ ටෙන්ඩර් මිලෙන් සියයට 10 ක් අඩුකර 2018 සැප්තැම්බර් 25 දින සිට 2018 ඔක්තෝබර් 09 දින දක්වා කාලය තුළ ටෙන්ඩර් කැඳවීම සිදුකර ඇතත් ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවූ අතර 2018 ඔක්තෝබර් 12 දින සියයට 15 ක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට සභා තීරණයක් ගෙන ඇති බව දන්වමි. |
| (ආ) | පොදු වෙළද පල අංක 40 ඌරුමස් කඩය සඳහා 2019 වර්ෂය සඳහා රු.1,034,000 කට බදු දීමේදී ගිවිසුමකට එළඹ නොතිබීම නිසා නැවතත් මිල අඩු කිරීමට සිදුවීමෙන් අවසානයට එකහවූ මිල රු.721,200 ක් වූ අතර මුල් මිල හා සැසදීමේදී රු.312,360 ක පාඩුවක් සිදු වී තිබුණි. | ටෙන්ඩර් ප්‍රදානය කිරීමෙන් පසුව ටෙන්ඩර්කරු සමඟ ගිවිසුම්ගත විය යුතු අතර වාර්ෂික තක්සේරුව සංශෝධනය, තක්සේරු දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත සිදුකළ යුතුවේ. | සියයට 10 ක් අඩු කිරීමෙන් පසු ඉදිරිපත්වූ එකම ටෙන්ඩරය පිළිගෙන ටෙන්ඩර්කරු හට අවශ්‍යතා සම්පූර්ණ කර ගිවිසුම් ගත වන ලෙස දන්වා යැවුවද ඔහු ඊට ඉදිරිපත් නොවුණු බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ |
|---|---|---|
| (අ) 2000 ජූනි 06 දින මිලදී ගෙන තිබූ ටොයොටා වර්ගයේ වෑන් රථය 2015 මාර්තු 19 දින අපහරණය කිරිම සුදුසු බවට නිර්දේශ කර තිබියදී එන්ජිම හා අනෙකුත් අලුත්වැඩියාවන් 17 ක් 2017 වර්ෂයේ සිදුකර රු.1,147,909 ක් ගෙවා තිබූ අතර එදින සිට 2019 අගෝස්තු දක්වා රු.501,322 ක අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. රියදුරු විසින් එන්ජිම් ඔයිල් කාන්දු වීම හා ඔල්ටර්නේටරය අක්‍රිය වීම ඇතුළු දෝෂ 13 ක් ඇති බව දක්වා අලුත්වැඩියා කර දෙන ලෙස කර තිබූ ඉල්ලීමට අනුව නැවතත් අයිතම 87 කට රු.1,461,300 ක ඇස්තමේන්තුවක් නියෝජිත ආයතනයකින් 2019 මැයි 08 දින ලබාගෙන තිබුණි. | අළුත්වැඩියාව සඳහා යන වියදම ආර්ථික වශයෙන් ඵලදායි විය යුතුවේ. | දෝෂ පිළිබඳ සැබෑ තත්ත්වය වටහා ගැනීමට මෙම වාහනයේ නියෝජිත ආයතනය වෙත යොමුකර රු.1,461,300 ක ඇස්තමේන්තුවක් ලබාගෙන ඇති අතර එම ඇස්තමේන්තුව අනුව අලුත්වැඩියාව මේ දක්වා සිදුකොට නොමැත. |
| (ආ) සභාව විසින් භුක්ති විඳින සෙක්කුවත්ත ක්‍රීඩා පිටියට අයත් බිම් කොටස් 18 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භුක්ති විඳින බිම් කොටස් වල නීත්‍යානුකූල අයිතිය සභාව සතුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | එම ඉඩම් කොටස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දෙවැනි වරටත් මිනින්දෝරු කටයුතු සිදු කොට ඇති අතර, එහි තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව දන්වමි. |

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 අප්‍රේල් 01 සිට 2019 මැයි 23 දක්වා මෝටර් ග්‍රේඩර 02 ක් කසළ තුනි කිරීමේ කටයුතුවල නිරත කර තිබූ අතර එම කාලය තුළ එක් මෝටර් ග්‍රේඩරයක් දිනකට පැය 10 ඉක්මවා දින 37 ක්ද, අනෙක් මෝටර් ග්‍රේඩරය දිනකට පැය 10 ඉක්මවා දින 06 ක්ද වෙන් වෙන් දිනවල කසළ තුනී කිරීමේ කටයුතුවල නිරතවී තිබුණි.පැය 10-21 ත් අතර | කාර්යයන් ඉටු කිරීමේදී බලය ලත් නිලධාරියකුගේ අධික්ෂණයට ලක් විය යුතුවේ. | 2020 මාර්තු 12 දින සභාව මගින් සියළුම ගෙවීම් නිවැරදි කර ඇති බව දන්වමි. |

අසාමාන්‍ය පැය ගණනක් දෛනිකව එම යන්ත්‍ර දෙකම එකවර කසළ තුනී කිරීමේ කටයුතුවල දින 32 ක් නිරතවී තිබුණද, එම දිනවල දිනකට බැහැර කර තිබූ සාමාන්‍ය කසළ ප්‍රමාණය ට්‍රැක්ටර් ලෝඩ් 03 ක් විය. 2019 මැයි 14 සිට මැයි 20 දක්වා වූ දින 07 කදී මුළු පැය 132 ක් සඳහා රු.745,500 ක් මෝටර් ග්‍රේඩර 02 ට ගෙවා තිබුණද එකී කාලය තුළ කසළ බැහැර කිරීමේ ස්ථානයට කසළ ගෙනැවිත් නොතිබුණි.

3.3 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ |
| --- | --- | --- |
| 2015 දෙසැම්බර් 29 දින ලබා ගෙන තිබූ බේලින් යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.4 ප්‍රසම්පාදනය

3.4.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 18 දින පවත්වා තිබූ ගිණුම් කාරක සභාව විසින් නගර සභාවට ලබාදුන් නියෝග ප්‍රකාරව 2016 වර්ෂයේ රු.1,130,435 ක් වැය කර සෙක්කුවත්ත ක්‍රීඩා පිටියේ ඉදිකර තිබූ පැසි පන්දු ක්‍රීඩා පිටිය පරිහරණය කලහැකි තත්ත්වයකට පත් කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාල ප්‍රමිතීන්ට අනුකූලව නිම කළ යුතු අතර ගිණුම් කාරක සභා නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කරමින් අදාල වත්කම් පරිහරණය කළ හැකි තත්ත්වයට පත්කිරීමට සභාව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) බාහිර ප්‍රතිපාදන යටතේ මාර්ග 03 ක සංවර්ධන කටයුතු සඳහා 2018 වර්ෂයේ රු.2,519,036 ක වටිනාකමකට ලියාපදිංචි සමිති වෙත පවරා තිබුණි.මෙම මාර්ගවල සංවර්ධන කටයුතු ඉටුකර නොතිබියදී ඒවා ඉටු කළ බවට ගෙවීම් වාර්තා පිළියෙල කොට ප්‍රාදේශීය ලේකම්ගෙන් මුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණි. | ඉටුනොකළ ව්‍යාපෘති ඉටුකළ බව දක්වා මුදල් ඉල්ලීම සුදුසු නොවේ. | ගෙවීම් වාර්තා සමඟ වවුචර්පත් පිළියෙල කර ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත්තේ 2018 වසර ඉක්මවා යාමට පෙර ප්‍රතිපාදන සභාව වෙත ගෙන්වා ගැනිමේ අදහසින් වන අතර මුදල් ගෙවිමක් කර නැති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සුදුවැල්ල කොම්පෝස්ට් අංගනයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීමේ IIIවන අදියර රු.2,500,000 ක ප්‍රතිපාදන මත ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පවරා නොතිබියදී මාර්ගයේ ABC අතුරා ඒ තුළ පස් පුරවා,මාර්ගය අසල සිමෙන්ති ගල් ගොඩගසා තිබුණි. | ගිවිසුම්ගතවීමෙන් අනතුරුව කර්මාන්ත ආරම්භ කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |